රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:385

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1987. නොවැම්බර් මස ...19.. දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## මධ්‍යම මට්ටමේ කාර්මික ඒකාබද්ධ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.

1978.10.31 දාතම් අංක:276 දරණ ආයතන චක්‍රලේඛ ලිපියට සහ මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවා ව්‍යවස්ථාවට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවා ව්‍යවස්ථාවේ VII වැනි පරිච්ඡේදයේ 2:2 වගන්තිය වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

> "2:2. II පන්තියේ 'අ' ශ්‍රේණියට උසස්වීම් කරනුයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ තුන් වසරක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් වූ නිලධාරීන් අතුරින් හෝ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ අවුරුදු හයක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇති හා රු. 16,560/=ක වාර්ෂික වැටුප් තලයේ එක් අවුරුද්දක සේවය කර ඇති නිලධාරීන් අතුරිනි."

03. කරුණාකර මධ්‍යම මට්ටමේ කාර්මික ඒකාබද්ධ සේවාවට අයත් තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි මේ අනුව සංශෝධනය කරනු මැනවි.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.